www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

06 ශ්‍රේණිය

# ඉතිහාසය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයිඃ
සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01 ක්‍රි:ව: පස්වන සියවසේ දී මහානාම හිමියන් විසින් ........................................................ රචනා කර ඇත. (මහාවංශය / දීපවංශය / චූලවංශය)

02 ශ්‍රී ලංකාව අතීතයේ දී සාර්ථක ලෙස ගොවිතැන් කළ නිසා .................................................... ලෙස හඳුන්වනු ලැබීය. (ඉන්දියන් සාගරයේ මුතුඇටය / පෙරදිග ධාන්‍යාගාරය / රතුකැට දිවයින)

03 වානර පරම්පරාවට අයත් චිම්පන්සියකුගෙන් මානවයකු බිහිවීමේ ක්‍රියාවලිය ........................................... ලෙස හැඳින්වේ. ( මානව විකාශනය / මානව පරිණාමය / මානව පරිහානිය)

04 පළමු වරට රබර් බෝලය සාදන ලද්දේ............................................ වැසියන්ය. (ඉන්දු නිම්න / හොවැංහෝ නිම්න / මායා ශිෂ්ටාචාර)

05 යුප්‍රටීස්, ටයිග්‍රීස් ගංගා පිහිටි ප්‍රදේශය වර්තමානයේ දී ................................................ හඳුන්වයි. (ඉරානය / ඉරාකය / පකිස්ථානය)

- **අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තිය බුද්ධ වර්ෂ 544 දී සිදු විය. (        )

07 ගොඩබිම මුලින්ම ශාක පැතිරී ගියේ පේලියෝසොයික යුගයේ දී ය. (        )

08 හෝමෝ හැබිලිස් මානවයා දක්ෂ දඩයක්කරුවෙකු විය. (        )

09 මමීකරණය ලෝකයට හඳුන්වාදීමේ ගෞරවය ඊජිප්තු ශිෂ්ටාචාරයට හිමි වේ. (        )

10 මහාවංශයේ සඳහන් ආකාරයට විජය නම් කුමාරයෙක් ලංකාවේ වයඹ දිග වෙරළේ පිහිටි තම්බපණ්ණියට ගොඩබැස ඇත. (        )



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 මිනිසා තමන්ගේ මළගිය ඥාතීන් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීමට පුරුදු වූයේ කුමන සංස්කෘතික අවධියේ ද?

(1) පූර්ව ශිලා යුගය (2) මධ්‍ය ශිලා යුගය (3) නව ශිලා යුගය (4) සිළුරියන් යුගය

12 වානරයෙකුව සිට තම ශක්තීන් දියුණු කරගෙන බුද්ධිමත් මිනිසා ලෙස නම් ලද මානවයා කවුද?

(1) හෝමෝ හැබිලස් (2) හෝමෝ ඉරෙක්ටස්

(3) හෝමෝ සාපියන් (4) හෝමෝ නියැන්ඩර් තාලෙන්සීස්

13 ඊජිප්තු ශිෂ්ටාචාරය බිහිවූයේ මින් කුමන ගංගා නිම්නය මුල්කරගෙන ද?

(1) හොවැංහෝ ගංගාව (2) සිංදු ගඟ

(3) නයිල් නිම්නය (4) යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා නිම්නය

14 නගරයක් අසල පළමු වරට වැවක් ඉදිකළ රජතුමා පහත රජවරුන් අතරින් තෝරන්න.

(1) දේවානම් පියතිස්ස රජතුමා (2) පණ්ඩුකාභය රජතුමා

(3) දුටුගැමුණු රජතුමා (4) ධාතුසේන රජතුමා

15 දේවානම් පියතිස්ස රජතුමා විසින් භික්ෂූන් වහන්සේලාට දානය වැළඳීම සඳහා සකස් කළ ගොඩනැගිල්ල මින් කුමක්ද?

(1) මහබෝගේ (2) ලහබත්ගේ (3) වටදාගේ (4) ප්‍රතිමාගේ

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

16 ලෝකයේ පැරණිතම අක්ෂර පද්ධතිය නිපදවන ලද්දේ ........................................ ශිෂ්ටාචාරයේ වැසියන් විසිනි.

17 ඉන්දු නිම්නයේ වැසියන් නිවාස ඉදිකිරීමේ දී ........................................ මැටි ගඩොල් භාවිතා කර ඇත.

18 ඊජිප්තු වැසියන් පාරාවෝ රජවරුන්ගේ මළ සිරුරු තැන්පත් කළේ ........................................ වලය.

19 විජය කුමරු ඇතුළු පිරිස ලංකාවේ ජනපද පිහිටුවාගත්තේ ........................................ ඔය නිම්නයේ ය.

20 පණ්ඩුකාභය කුමරු අධ්‍යාපනය ලැබූයේ ........................................ නම් බ්‍රාහ්මණයකුගෙන් ය. (ලකුණු $2 \times 20 = 40$)




Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

**06 ශ්‍රේණිය** **ඉතිහාසය** **ඉතිරි කොටස**

## II කොටස




- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. ලෝක සිතියම උදව් කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) ලෝක සිතියමේ A, B වලින් දක්වා ඇත්තේ ලෝකයේ පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර බිහි වූ ගංගා දෙකකි. එම ගංගා දෙක A, B පිළිවෙලින් නම් කරන්න. (ල. 02)

(ii) ඔබ සිතියමේ හඳුනාගත් ගංගා නිම්න වලට අදාළ ශිෂ්ටාචාර පිහිටි මහාද්වීප දෙක නම් කරන්න. (ල. 02)

(iii) A පින්තූරයේ දැක්වෙන දේවාලය කුමක් ද? එය පිහිටියේ කුමන නගරයේ ද? (ල. 02)

A



(iv) මෙසපොතේමියානු වැසියන් වැඳුම් පිදුම් කළ ස්වභාවික වස්තු 02 ක් නම් කරන්න. (ල. 02)

(v) B පින්තූරයෙන් පෙන්නුම් කරන වැසියන් අයත් වන ශිෂ්ටාචාරය දක්වන්න. (ල.02)

B



(vi) ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් වල ස්වරූපය අනුව ඔවුන් නියෝජනය කරන සමාජ ස්තරය කුමක් ද? (ල. 02)

(vii) C පින්තූරයේ දැක්වෙන දෙය නම් කරන්න. (ල. 02)

(viii) එය සොයාගත් ස්ථානය කුමක් ද? (ල. 02)

C



02 පහත සඳහන් වන්නේ ඉතිහාසයේ කාල මැනීමට භාවිතා කළ ක්‍රම තුනකි. එම ක්‍රම තුන නිර්මාණයට හේතු වූ සිදුවීම් තුන A, B, C ප්‍රකාශ අතරින් තෝරා ලියන්න.

- ⋆ බුද්ධ වර්ෂ I ..........................................................................................
- ⋆ ශකවර්ෂ II ..........................................................................................
- ⋆ හිජ්රා වර්ෂ III ..........................................................................................

A ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තියෙන් පසු කාලය

B මහම්මද් තුමා මක්කම සිට මදීනා නුවරට පැමිණි වර්ෂය

C ගෞතම්පුත්‍ර සාතකර්ණි රජු ශකවරු පරාජය කිරීම

D බුදුන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු කාලය

E ක්‍රිස්තුස් වහන්සේ ඉපදීමට පෙර කාලය (ල. 03)

(ii) පහත දැක්වෙන්නේ මිනිසකු වීමට නැඹුරුවක් දක්වූ විවිධ මානවයින්ගේ දක්ෂතාය. එම දක්ෂතා දක් වූ මානවයින් වරහන් තුළින් තෝරා ඉදිරියෙන් ලියන්න. (ල. 04)

- පාද දෙකෙන් ඇවිදයාම i. ..........................................................................
- ගලකින් තවත් ගලකට ගසා පතුරක් ඉවත් කරගෙන මුවහත් මුහුණතක් සාදා ගැනීම ii. ..........................................................................

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස තැනීම — iii. ..........................................................
- අදහස් හුවමාරුවට භාෂාව භාවිතා කිරීම — iv. ..........................................................

(හෝමෝ හැබිලස්, ඔස්ට්‍රලොපිතිකස්, නියැන්ඩර්තාලෙන්සිස්, හෝමෝසේපියන්, හෝමෝ ඉරෙක්ටස්) (ල. 04)

(iii) පහත සඳහන් වන්නේ මිනිසාගේ සංස්කෘතික දියුණුව සිදු වූ විවිධ අවධි වලදී ඔහු කළ ක්‍රියාකාරකම් කීපයකි. ඒවා අයත් වන කුමන සංස්කෘතික අවධිය සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

A කණ්ඩායම් ලෙස ජීවත් වීම

B දුනු ඊතල භාවිතා කර දඩයම් කිරීම

C ධාන්‍ය වර්ග වගා කිරීම ආරම්භ කිරීම

D මළගිය ඥාතීන් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම

E එකතැනක දිගු කාලයක් ජීවත්වීම

F භාණ්ඩ හුවමාරුව ආරම්භ වීම

G ඇටසැකිලි මත වර්ණ ආලේප කිරීම

H ගම්මාන බිහිවීම

| පුරා ශිලා යුගය | මධ්‍ය ශිලා යුගය | නව ශිලා යුගය |
|---|---|---|
| | | |

(ල. 04)

03 පහත සඳහන් වන්නේ ශිෂ්ටාචාර වලට අදාළ විශේෂ තොරතුරු දැක්වෙන වචන සටහනකි. එම සටහන උදව්කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | ඌ | ඊ | | | |
| | එ | යු | ප්‍ර | ටී | ස් | ගී | |
| | න් | එ | න් | ලි | ලි | සා | |
| අ | කි | මො | හො | න් | ජ | දා | රෝ |
| නු | කි | කා | ලි | බ | න් | ග | න් |
| හ | ර | ප් | පා | ඩො | ල | වී | ර |
| | පා | රා | වෝ | නෙ | ෆ | ටී | ටී |
| | ටූ | ට | න් | කා | ම | න් | |
| | | ම | මී | ය | | | |

(i) සටහනින් සොයා මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට අයත් දෙවිවරු තිදෙනකු නම් කරන්න.

i. ..........................................................

ii. ..........................................................

iii. .................................................. (ල. 03)

(ii) මෙම සටහන උදව් කරගෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් නගර 04 ක් තෝරා ලියන්න.

A ..........................................................

B ..........................................................

C ..........................................................

D .......................................................... (ල. 04)

(iii) i. ඊජිප්තු පිරමීඩ දක්නට ඇති නගරය තෝරා ලියන්න.

ii. ඊජිප්තුව පාලනය කළ රජපෙළපත ලියන්න.

iii. රනින් කළ වෙස්මුහුණකින් මුහුණ ආවරණය කළ මමිය අයත් රජු සොයා ලියන්න.

iv. අක්හෙනතන් රජුගේ පසුව කෙටි කලක් ඊජිප්තුව පාලනය කළ රැජිනගේ නම ලියන්න. (ල. 04)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

04 පහත සඳහන් සුවිශේෂී සිදුවීම් වලට අදාළ ශිෂ්ටාචාරය සොයා වගුවේ හිස්තැන් පුරවන්න.

(i)

| සිදුවීම | ශිෂ්ටාචාරය |
|---|---|
| ★ ලෝකයේ පැරණිම නීති පද්ධතිය වන හමුරාබි නීති සංග්‍රහය රචනාකිරීම | (1) ................................ |
| ★ සැලසුම් සහගත නගර නිර්මාණය | (2) ................................ |
| ★ මළ සිරුර කල් තබා ගැනීම | (3) ................................ |

(ල. 03)

(ii) පහත සඳහන් වන්නේ මෙසපොතේමියානු සමාජයට අයත් ලක්‍ෂණ කීපයකි. ඒවා අතරින් පූජක ලෙස දක්වන සමාජ ස්තරයට අයත් ලක්‍ෂණ 04 ක් තෝරා ලියන්න.

A ★ ආගමික කටයුතු වලට සම්බන්ධය
B ★ වෛද්‍යවරු ලෙස කටයුතු කිරීම
C ★ කාන්තාවන් එක් උරක් වැසෙන ලෙස ඇඳුම් ඇඳීම
D ★ රනින් කළ ආභරණ පැළඳීම
E ★ බැටළු සම් කබායක් ඇඳ සිටීම
F ★ පිරිමි කොණ්ඩය දිගට වැවීම
G ★ හිස මුඩු කිරීම

A ................................................................................
B ................................................................................
C ................................................................................
D ................................................................................(ල. 04)

(iii) ඉන්දු නිම්න වැසියන් භාවිත කළ ලෝහවර්ග 04 ක් නම් කරන්න.

i. .............................................. iii. ..............................................
ii. .............................................. iv. .............................................. (ල. 04)

05 (i) මෙරට මුලින්ම වාසය කළ මිනිසුන් පහත සඳහන් කාර්යයන්හිදී ක්‍රියාකළ ආකාරය ලියන්න.

A ආහාර සපයා ගැනීම ,..............................................................
B වැසි කාලයට ජීවත් වූ ආකාරය ..............................................................
C අවමංගල චාරිත්‍ර ..............................................................(ල. 03)

(ii) විජය කුමරු ලංකාවට ගොඩබට අවධියේ මෙරට සිටි ජනතාව දියුණු වෙමින් පැවති ජන කොට්ඨාසයකි.

පහත සඳහන් අවස්ථාවලදී ඔවුන් කටයුතු කළ ආකාරය ලියන්න.

i. මෙවලම් තනාගැනීම
ii. නිවාස තැනීම
iii. ජීවත්වීමට ප්‍රදේශ තේරීම
iv. අවමංගල චාරිත්‍ර පැවැත්වීම (ල. 04)

(iii) වරහන් තුළ ඇති වචන යොදා පහත ඡේදය සම්පූර්ණ කරන්න.

විජය නමින් හැඳින්වෙන කුමරෙකු පිරිවර i. ............................ සමඟ ක්‍රි. පූ. 544 දී ii. ............................ සිට පැමිණි බව iii. ............................ නම් ඓතිහාසික මූලාශ්‍රයෙන් තහවුරු වේ. ඔවුන් ගොඩබට ස්ථානය iv. ............................ නම් ලංකාවේ බටහිර වෙරළේ පිහිටි ස්ථානයක් බවත් තහවුරු වී ඇත.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

( හත්සියයක් , ඉන්දියාවේ , පකිස්ථානය , මහාවංශය, තම්බපණ්ණි ) (ල. 04)

06 (i) විජය කුමරු පැමිණීමෙන් පසු ඔහුගේ පිරිස ඉදිකරගත් ජනාවාස 03 ක් නම් කරන්න.

A - ..............................

B - ..............................

C - . (ල. 03)

(ii) පණ්ඩුකාභය කුමරු අනුරාධපුරය අංග සම්පූර්ණ නගරයක් බවට පත්කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කළ දේවල් ලියන්න.

i. නගරයේ ආරක්ෂාව . ..............................

ii. නගරයට ඇතුළු වීමට . ..............................

iii. නගරය සුන්දර කිරීමට . ..............................

iv. නගරය පිරිසිදු කිරීමට . (ල. 04)

(iii) පණ්ඩුකාභය චරිතයෙන් ගතහැකි ආදර්ශ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

07 A ★ ස්වර්ණපාලි කුමරිය විවාහ කර ගැනීම

B ★ දෙවියන්ට ප්‍රිය වූ යන විරුද නාමය භාවිතා කිරීම

C ★ විවිධ ආගම් අදහන්නන් සඳහා දේවාල ඉදිකිරීම

D ★ ධර්මාශෝක අධිරාජයාට දූත පිරිස් යැවීම

E ★ බසවක්කුලම වැව ඉදිකිරීම

F ★ අභිෂේකයට අවශ්‍ය රාජ කකුධ භාණ්ඩ ඉන්දියාවෙන් ගෙන්වීම

(i) ඉහත සඳහන් ප්‍රකාශ වලින් දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය කාලයට අදාළ සිදුවීම් තෝරා ලියන්න. (ල. 03)

(ii) (අ) ථූපාරාම දාගැබේ නිධන් කළ ධාතුන් වහන්සේ නම් කරන්න. (ල. 01)

(ආ) එම දාගැබ සඳහා වටදාගෙයක් ඉදිකළ රජු කවුරුන්ද? (ල. 01)

(iii) පහත සඳහන් උපකාරක පද උදව් කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට : 1. දේවානම්පියතිස්ස රජු ඉන්දියාවට පිටත් කළ දූත කණ්ඩායමේ නායකයාය.


2. දේවානම්පියතිස්ස රජු මිහිඳුහිමිට පූජා කරන ලද ආරාමයකි.

3. මිහිඳු හිමියන් ප්‍රමුඛ පිරිසේ පැමිණි සාමනේර හිමියන්.

පහළට : 4. මිහිඳු හිමි ප්‍රමුඛ කණ්ඩායමේ සිටි රහතන්වහන්සේ නමකි.

5. දේවානම් පියතිස්ස රජු මිහිඳු හිමියන් ඇතුළු පිරිසට පූජා කළ උයනකි.

6. මහින්දාගමනයෙන් පසුව ලංකාවේ ඉදිකළ ප්‍රථම දාගැබ (ල. 06)






agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!